ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date. 2026.03.04

පැමිණිලි පාර්ශවය : එල්.ආර්.ඊ.බණ්ඩාර මයා,
අංක 9, යග්ගහපිටිය,
ගුන්නැපාන.

වගඋත්තර පාර්ශවය : සභාපති,
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
අංක 34, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

පැමිණිලි අංකය : **HRC/2856/25**

**පැමිණිලි පාර්ශවයේ පැමිණිල්ල:**

පැමිණිලිකරු විසින් 2025.08.02 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර සිටින්නේ, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30හි විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවයේ නියුතු නිලධාරීන් 44දෙනෙක් සඳහා තනතුරු නාම 2012 වර්ෂයට පෙරදාතම් නොකිරීම හේතුවෙන් අසාධාරණයට පත් සේවකයන් පිරිසක් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද අංක SC/FR/83/2023 දරණ මූලික අයිතිවාසිකම් නඩුවේදී අධ්‍යක්ෂ මණ්ඩලය සහ පෙත්සම්කරුවන් අතර ඇති කර ගත් එකඟතාවයට යටත්ව නඩුව අවසන් කළ බවත්, එකී එකඟතාවය පරිදි, අගතියට සේවකයන් 44දෙනෙක් අතරින් සේවකයන් 39දෙනෙකුට හිමි හිඟ වැටුප් සහ හිඟ පාරිතෝෂික දීමනා ලබාදීමට කටයුතු කර ඇති නමුත් තමා ඇතුළු ඒ වන විට විශ්‍රාම ගොස් සිටි සේවකයන් පස්දෙනෙකුට හිමි හිඟ වැටුප් සහ හිඟ පාරිතෝෂික දීමනා ලබාදීමට කටයුතු නොකිරීම හේතුවෙන් අගතියට පත්ව ඇති බවයි. ඒ අනුව,

අදාළ හිඟ වැටුප්, හිඟ පාරිතෝෂික දීමනා සහ අධිකාරිය විසින් ගෙවනු ලබන වෙනත් දීමනාවල හිඟ මුදල් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස මෙම පැමිණිල්ල ඉදිරිපත් කරමින් ඉල්ලා සිටී.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම:**

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී විසින් යොමු කර ඇති 2025.10.12 දිනැති අංක 3/2/3/3/2/426-II දරණ වාර්තාවට අනුව, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30හි විධිවිධාන ප්‍රකාරව තනතුරු නාම ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේදී පැන නැගී ඇති ගැටලුව සම්බන්ධයෙන් 2025.09.26 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කිරීමෙන් අනතුරුව එකී කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30ට අදාළව 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා ක්‍රියාත්මක වූ අධ්‍යක්ෂ මණ්ඩලය(පූර්ව අධ්‍යක්ෂ මණ්ඩලය) විසින් ගන්නා ලද තීරණයන් මුදල් අමාත්‍යාංශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමැතිය ලබා නොගෙන ක්‍රියාත්මක කර ඇති බවට වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයට නිරීක්ෂණය වූ බැවින් ඒ සම්බන්ධයෙන් උපදෙස් පතා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කර ඇති බවට දන්වා ඇත.

**නිරීක්ෂණ:**

2023.11.22 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයන් පිරිසක් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති අංක SC/FR/83/2023 දරණ මූලික අයිතිවාසිකම් පෙත්සම සම්බන්ධයෙන් සලකා බලා ඇත. එහිදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත්තේ, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 යටතේ අගතියට පත් පාර්ශවයන් වෙත සාධාරණයක් ඉටුකර දීම අනුමත කරන බවයි. ඒ අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති අංක SC/FR/83/2023 දරණ මූලික අයිතිවාසිකම් පෙත්සම ඉල්ලා අස්කර ගැනීමට පෙත්සම්කරුවන්ගේ එකඟතාවය ලිඛිතව දිවුරුම් ප්‍රකාශයක් මඟින් ලබාදෙන්නේ නම් පෙර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 10161 මඟින් අත්හිටවනු ලැබූ වරප්‍රසාද අත්හිටුවීම ඉවත් කිරීමට කටයුතු කරන බවට දන්වා ඇත. ඒ අනුව, එකී එකඟතාවය පරිදි අංක SC/FR/83/2023 නඩුවේ පෙත්සම්කරුවන් විසින් මූලික අයිතිවාසිකම් පෙත්සම ඉල්ලා අස්කර ගෙන ඇති බවත්, ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 2024.06.14 දින එකී සමථය හා කොන්දේසිවලට යටත්ව නඩුව නිශ්ප්‍රභා කර ඇති බවත් නිරීක්ෂණය වේ.

ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල එකඟතාවය පරිදි එම නඩුවේ පාර්ශවකරුවන් ඇතුළු සේවකයන් 39දෙනෙක් සඳහා අදාළ වරප්‍රසාද ලබාදීමට කටයුතු කර ඇති නමුත් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ මෙම පැමිණිල්ල ගොනු කර ඇති පැමිණිලිකරු ඇතුළු පහත නම් සඳහන්

නිලධාරීන් විශ්‍රාම ගොස් සිටින බැවින් එකී වරප්‍රසාද ලබාදීමට කටයුතු කර නොමැති බවට නිරීක්ෂණය වේ.

1. එල්.ආර්.ඊ.බණ්ඩාර මයා
2. කේ.එච්.සී. ජයලත් මිය
3. ටී.එස්. මල්කාන්තිගේ මිය
4. කේ.ජෙගනාදන් මයා
5. පී.ඒ.එස්.පී. ආරියවංශ මයා

වගඋත්තර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති කරුණුවලට අනුව, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30හි විධිවිධාන ප්‍රකාරව තනතුරු නාම ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේදී පැන නැගී ඇති ගැටලුව සම්බන්ධයෙන් 2025.09.26 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කිරීමෙන් අනතුරුව පූර්ව අධ්‍යක්ෂ මණ්ඩලය (2020-2024 වර්ෂවල ක්‍රියාත්මක වූ) විසින් ගෙන ඇති තීරණ මුදල් අමාත්‍යාංශය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමැතිය ලබා නොගෙන ක්‍රියාත්මක කර ඇති බවට නිරීක්ෂණය වූ බැවින් ඒ සම්බන්ධයෙන් උපදෙස් පතා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. කෙසේනමුත් සේවයේ යෙදී සිටි සේවකයන් 39දෙනෙකුට අදාළ වරප්‍රසාද ලබා දී තිබියදී පැමිණිලිකරු ඇතුළු විශ්‍රාම ලබා සිටින සේවකයන් පස්දෙනෙකුට පමණක් අදාළ වරප්‍රසාද ලබා නොදීමට කටයුතු කිරීම තුළින් ඔවුන් අගතියට පත්ව ඇති පසුබිමක පූර්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයක් සම්බන්ධයෙන් නැවත නීතිපතිවරයාගෙන් විමසීම තුළින් මෙම පැමිණිලිකරු ඇතුළු වරප්‍රසාද නොලත් නිලධාරීන් නැවත වරක් අගතියට පත්වන බව නිරීක්ෂණය වේ.

තවද කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සඳහා නව කාර්ය මණ්ඩල ව්‍යුහයන් අනුමත කර ඇති අතර, ඒ අනුව එක් එක් තනතුරට අදාළ බඳවා ගැනීම් පටිපාටිය අනුමත කරන ලද 2012.03.19 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සිදුකරන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් උපදෙස් ලබා දී ඇත. අදාළ බඳවා ගැනීම් පටිපාටිය අනුමත කරන ලද 2012.03.19 දින වන විට මෙම පැමිණිලිකරු ඇතුළු අගතියට පත්ව සිටින නිලධාරීන් පිරිස වගඋත්තර ආයතනය තුළ සේවයේ යෙදී සිට ඇත. ඒ අනුව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව සිදුකරන ලද ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය හේතුවෙන් ගැටළුවලට මුහුණදී සිටින සේවකයන් හට සහන සැලසීමේදී ඔවුන්ට හිමි තරාතිරම අනුව අදාළ වැටුප් තලවල පිහිටුවා ගැලපීම් කර වැටුප ලබාදීමටත් ඊට අදාළ වරප්‍රසාද හා ප්‍රතිලාභ ගැලපීම් කර ලබා දීමටත් කටයුතු කර ඇති බැවින් මෙම පැමිණිලිකරු ඇතුළු පිරිසට ද අදාළ වැටුප් සංශෝධන සම්බන්ධයෙන් නීතිමය හිමිකමක් පවතින බව

නිරීක්ෂණය වේ. නියමිත දිනට එම හිමිකම ලබා තිබුණද ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර තිබූ අංක SC/FR/83/2023 දරණ මූලික අයිතිවාසිකම් නඩුවේ සමථය ක්‍රියාත්මක කරන අවස්ථාව වන විට මෙම පැමිණිලිකරු ඇතුළු පිරිස විශ්‍රාම ලබා ඇත. කරුණු එසේ හෙයින්, අදාළ කරුණු පරීක්ෂා කිරීමේදී නියමිත දිනට එකී වැටුප් සංශෝධනය ක්‍රියාත්මක කළේ නම් මෙම පැමිණිලිකරු ඇතුළු පිරිසට එම හිමිකම ඒ ආකාරයෙන්ම ලැබෙන බවට ලේඛන මඟින් තහවුරු වේ.

**නිගමනය:**

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30හි විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවයේ නියුතු නිලධාරීන් 44දෙනෙක් සඳහා තනතුරු නාම 2012 වර්ෂයට පෙරදාතම් නොකිරීම හේතුවෙන් අසාධාරණයට පත් සේවකයන් පිරිසක් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද අංක SC/FR/83/2023 දරණ මූලික අයිතිවාසිකම් නඩුවේදී අධ්‍යක්ෂ මණ්ඩලය සහ පෙත්සම්කරුවන් අතර ඇති කර ගත් එකඟතාවයට යටත්ව නඩුව අවසන් කර තිබියදී, එකී එකඟතාවය පරිදි, අගතියට සේවකයන් 44දෙනෙක් අතරින් සේවකයන් 39දෙනෙකුට හිමි හිඟ වැටුප් සහ හිඟ පාරිතෝෂික දීමනා ලබාදීමට කටයුතු කර ඇති නමුත් මෙම පැමිණිලිකරු ඇතුළු ඒ වන විට විශ්‍රාම ගොස් සිටි සේවකයන් පස්දෙනෙකුට හිමි හිඟ වැටුප් සහ හිඟ පාරිතෝෂික දීමනා ලබාදීමට කටයුතු නොකිරීම තුළින් වගඋත්තර පාර්ශවය විසින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කර ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම මෙම පැමිණිලිකරු ඇතුළු පිරිස සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

I. විශ්‍රාම ලබා තිබීම හේතුවෙන් අදාළ හිඟ වැටුප් සහ හිඟ පාරිතෝෂික දීමනා අහිමි වූ මෙම පැමිණිලිකරු ඇතුළු නිලධාරීන් පස්දෙනා හට ප්‍රතිව්‍යුහගතකරණ හිමිකම් ලබන දිනයේ සිට විශ්‍රාම ලැබූ දිනය දක්වා එකී හිඟ වැටුප් සහ හිඟ පාරිතෝෂික දීමනා ගෙවීමට වගඋත්තරකරු කටයුතු කළ යුතුය.

II. කාර්යමණ්ඩල සම්බන්ධව මෙවැනි ගැටළු හා විෂමතා ඉදිරියේදී ඇති නොවීමට සභාපති ඇතුළු අධ්‍යක්ෂවරුන් විසින් සුදුසු කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කිරීමට පියවර ගත යුතුය.

2026. 04.22 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ අදාළ නිර්දේශය ක්‍රියාත්මක කර තිබේද නැද්ද යන්න පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු,
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙ...
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

මහාචාර්ය ටී.තනරාජ්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Prof. T. Thanaraj
Commissioner
Human Rights Commissioner of Sri Lanka

පිටපත් -: (1) අමාත්‍යතුමා, - කාරුණික දැනගැනීම සඳහා
නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය,
සෙත්සිරිපාය, අදියර - II,
බත්තරමුල්ල.

(2) ලේකම්, - සුදුසු කටයුතු සඳහා
නිවාස, ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය,
සෙත්සිරිපාය, අදියර - II,
බත්තරමුල්ල.